ISBN 978-955-4563-72-8

# ශ්‍රී ලංකාවේ ආර්ථික ප්‍රතිපත්ති හා 66 වසරක ආර්ථික ප්‍රගතිය පිළිබඳ විමසීමක්

ජී.එම්. හේනේගෙදර

**සංක්ෂේපය**

*නිදහසින් පසු වර්තමානය දක්වා ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක කළ සාර්ව ආර්ථික ප්‍රතිපත්ති පිළිබඳව විමර්ශනය කෙරෙන මෙම ලිපියෙන් 1948 සිට වර්තමානය දක්වා ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක කල ආවෘත සහ විවෘත ආර්ථික ප්‍රතිපත්ති, ආර්ථික කාර්‍ය සාධනය සහ ප්‍රතිපත්ති බලපෑම පිළිබඳව සවිස්තරාත්මක විග්‍රහයක් සිදුකර ඇත. ද්වීතිය දත්ත මත පදනම් වු මෙම ලිපිය මගින් ආර්ථිකයේ ගමන් දිසාව පිළිබඳව විමර්ශනය කෙරේ.*

**හැඳින්වීම**

ආර්ථික ප්‍රතිපත්තියක් යනු රටක ආර්ථික සංවර්ධන ක්‍රියාවලියේ දිශාවන්, අරමුණු උපාය මාර්ග සහ ක්‍රියවලින් පෙන්නුම් කරන ලේඛනයක් ලෙස හැඳින්විය හැක. නිදහසින් පසු 66 වසරක ශ්‍රී ලංකා ආර්ථිකයේ ප්‍රතිපත්ති මග තීරණය වුයේ අදාළ වකවානුවලදී ඊට මුහුණ දුන් ගැටළු, දේශපාලන හා ආර්ථික දර්ශනය, ගෝලීය සංවර්ධන බලවේග, සම්පත් හිමිකම සහ දේශිය කළමනාකරණ හැකියාව මතබව පෙනේ. නිදහස ලැබිමට පෙර සිටම රට මුහුණ දුන් ගැටළු සහ අභියෝග වර්තමානය දක්වාම පවතින අතර මෙරට පාලනය කල දේශපාලන පක්ෂ හා රජයන්වල දේශපාලන දර්ශනය, ලෝක බැංකුව, ජාත්‍යන්තර මුල්‍ය අරමුදල සහ ලෝක වෙළඳ සංවිධානවල ප්‍රතිපත්ති හා උපාය මාර්ග අනුගමනය කිරීම මගින් එය තුලනය කිරීමට කටයුතු කරනු ලැබේ. එලෙස ක්‍රියාත්මක කරනු ලබන සාර්ව ආර්ථික ප්‍රතිපත්ති රටක ආර්ථික සංවර්ධනය අඛන්ඩව පවත්වාගෙන යෑමට කොතරම් දායකත්වයක් දක්වන්නේද යන්න විමසිම අවශ්‍ය වන්නේ රටක ආර්ථික ස්ථාවරත්වය එමගින් තීරණය වන නිසයි. ඒ අනුව 1948 වර්ෂය සිට 2014 දක්වා ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක කරන ලද ආර්ථික සංවර්ධන ප්‍රතිපත්ති සහ ක්‍රමෝපායන් පිළිබඳව පුළුල් විමර්ශනයක් කිරීම මෙම ලිපියෙන් සිදු කෙරෙන අතර එය ප්‍රධාන ප්‍රතිපත්ති යුග (Policy Regimcs) තේමා කරගෙන සිදු කෙරේ.ඒ අනුව 1948 සිට 2014 දක්වා ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වූ ආර්ථික ප්‍රතිපත්ති පිළිබඳවත් එහි බලපෑම පිළිබඳවත් විමර්ශනය කිරීමට අපේක්ෂා කෙරේ.

මුලික වශයෙන් මෙම විමර්ශනයආර්ථික ප්‍රතිපත්ති සඳහා පදනම් වූ ගැටළු, ක්‍රමෝපායන් සහ ආර්ථික දර්ශනය යන කරුණු මත පදනම් වන අතර ඒ අනුව ආර්ථික ප්‍රතිපත්තිවල බලපෑම විමර්ශනය කිරීමට අපේක්ෂා කෙරේ. කැලණිය විශ්වවිද්‍යාලයේ දිගු කලක් සේවය කොට විශ්‍රාම යන මහාචාර්ය ජී.ඩබ්. ඉන්ද්‍රාණි මහත්මියගේ සේවයට උපහාරයක් වශයෙන් මෙම ලිපිය ඉදිරිපත් කෙරේ. මෙම ලිපිය ප්‍රධාන වශයෙන් ද්විතියික දත්ත මත පදනම් වන අතර විස්තරාත්මක සංඛ්‍යා ලේඛන භාවිතා කරනු ලැබීය. එය ප්‍රධාන කොටස් 04ක යටතේ ඉදිරිපත් කර ඇත.

ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක කරන ලද ආර්ථික ප්‍රතිපත්ති මුලික වශයෙන් මිශ්‍ර ආර්ථික ප්‍රතිපත්ති වශයෙන් හැඳින්විය හැකි වුවද එම ප්‍රතිපත්තිවල දර්ශනය, උපාය මාර්ග සහ ක්‍රියාවලින් අනුව ප්‍රධාන ප්‍රතිපත්ති යුග 03 කට බෙදිය හැක.

---

මෙම ලිපිය සිංහල භාෂාවෙන් පරිගණකයට එක්කල රුවිනි වසන්තිට මාගේ ස්තුතිය පුද කෙරේ.

1)1948 - 1977 දක්වා ක්‍රියාත්මක කළ අවෘත ආර්ථික ප්‍රතිපත්ති හා අභ්‍යන්තරාභිලෝකන ප්‍රතිපත්ති

(2) 1977 - 2004 දක්වා ක්‍රියාත්මක කළ නිදහස් විවෘත ආර්ථික ප්‍රතිපත්ති හා බාහිරාවලෝකන ආර්ථික ප්‍රතිපත්ති

(3) 2004 සිට 2014 දක්වා ක්‍රියාත්මකකළමහින්ද චින්තන ආර්ථික ප්‍රතිපත්ති

ප්‍රධාන වශයෙන් මෙලෙස කාල පරිච්ජේද අනුව ප්‍රතිපත්ති යුගවර්ගිකරණය කල හැකි වුවත් මෙම සෑම යුගයක්ම දේශපාලන කාල වකවානු අනුව බෙදා දැක්විය හැක. ඒ අනුව එක්සත් ජාතික පක්ෂ ප්‍රතිපත්ති හා ශ්‍රි ලංකා නිදහස් පක්ෂ හෝ වාමාංශික පක්ෂ ප්‍රතිපත්ති යුග වශයෙන් ද බෙදා දැක්විය

*ISBN 978-955-4563-72-8*

හැක. එනමුදු මෙම ලිපිය මගින් අවධානයට යොමු කරන්නේ ප්‍රධාන ආර්ථික ප්‍රතිපත්ති යුග පිළිබඳව පමනි. එය ප්‍රධාන කොටස් 3ක් යටතේ පැහැදිලි කෙරේ.

1. අවෘත ආර්ථික ප්‍රතිපත්ති යුගය (1948 - 1977 දක්වා)

1948 සිට 1977 දක්වා වසර 30 කට ආසන්න කාලයක් තුළ ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක කල ආර්ථික ප්‍රතිපත්ති ආවෘත ආර්ථික ප්‍රතිපත්ති ලෙස නම් කලත් වඩාත් යෝග්‍ය වන්නේ මිශ්‍ර ආර්ථික ප්‍රතිපත්ති ලෙස හැඳින්විමයි. ඊට හේතුව වන්නේ නිදහස ලැබූ මුල් අවධියේ එනම් 1948 - 56 දක්වා ක්‍රියාත්මක කල ප්‍රතිපත්ති ප්‍රධාන වශයෙන් ආනයන ආදේශනය සහ රාජ්‍ය මැදිහත්වීම වැනි ආවෘත ආර්ථික ප්‍රතිපත්ති මත තීරණය විමය. එනමුත් 1965 - 70 කාලයේ ක්‍රියාත්මක වූ එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවේ ප්‍රතිපත්ති නිදහස් ආර්ථික ප්‍රතිපත්ති වලට බරවිය. එසේම 1970 - 77 කාලයේ ක්‍රියාත්මක වූ ප්‍රතිපත්ති ප්‍රධාන වශයෙන් අභ්‍යන්තරාභි ලෝකන ප්‍රතිපත්ති හෙවත් පූර්ණ රාජ්‍ය මැදිහත්වීම හා ආනයන ආදේශන ප්‍රතිපත්ති මත පදනම් විය. 1948 - 77 කාල වකවානුවේදී රජයන් 06ක් බලයට පත්වූ අතර එක්සත් ජාතික පක්ෂ සහ ශ්‍රී ලංකා නිදහස් පක්ෂ ප්‍රමුඛ මහජන එක්සත් පෙරමුණ වරින්වර බලයට පත්විය. මෙහිදි පැහැදිලිව දක්නට හැකි කරුණක් වන්නේ එක්සත් ජාතික පක්ෂ පාලන කාල වලදී නිදහස් ආර්ථික ප්‍රතිපත්ති වලට බරවූ මිශ්‍ර ආර්ථික ප්‍රතිපත්තියක් අනුගමනය කිරීමත් ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ප්‍රමුඛ සන්ධාන රජයන් අවෘත ආර්ථික ප්‍රතිපත්තිවලට බරවූ මිශ්‍ර ආර්ථික ප්‍රතිපත්තියක් අනුගමනය කිරීමත් කර ඇති බවයි. මේ බව ශ්‍රී ලංකාවේ දේශපාලන ඉතිහාසය අධ්‍යනය කිරිමෙන් තව දුරටත් පැහැදිලි කරගත හැක. කෙසේ නමුත් 1948 - 77 කාල වකවානුවේදී ක්‍රියාවට නංවන ලද ප්‍රධාන ආර්ථික ප්‍රතිපත්ති සහ වැඩසටහන් 04ක් හඳුනා ගත හැක. (කරුණාතිලක, එච්.එන්.එස්. 1987)

1. සය අවුරුදු වැඩසටහන (1947 - 53)

2. සය අවුරුදු ආයෝජන වැඩසටහන (1954 - 60)

3. දස අවුරුදු සැලැස්ම (1958 - 68)

4. පස් අවුරුදු සැලැස්ම (1972 - 77)

1. සය අවුරුදු වැඩසටහන (1947 - 53)

1947 / 48 හා 1948 - 49 වර්ෂය සඳහා රජය විසින් ඉදිරිපත් කරන ලද අයවැය ලේඛන පදනම් කරගත සය අවුරුදු කාලයත් සඳහා වාර්ෂිකව ඉදිරිපත් කරන ලද අයවැය ලේඛණවල එකතුවක් ලෙස මෙම වැඩසටහන හැඳින්වේ. මෙම වැඩසටහ මගින් අවධාරණය කල කරුණු කිපයකි. එනම් තෙත් කලාපය ආශ්‍රිත වැවිලි භෝග වගාව පූර්ණ වශයෙන් ව්‍යාප්ත වී ඇති බවත් එමනිසා වියලි කලාපය සංවර්ධනය කොට සහල් අතින් රට ස්වයං පෝෂිත කලයුතු බවය. කාර්මික අංශය දියුණු කිරීමෙන් ඒ සඳහා ආනයන ආදේශන කර්මාන්ත කෙරෙහි අවධානය යොමු කිරිමෙන් සිදු කරන ලදී. සයඅවුරුදු වැඩසටහන පූර්ණ වශයෙන් ආර්ථික සැලැස්මක් නොවුනත් මෙමගින් යටත් විජිත ආර්ථිකය නිසා උරුමවී කාලිනව පවතින ගැටළු ගැන අවධානය යොමු කල යුතුවිය. ගොඩ්ප්‍රි ගුණතිලක විසින් එය පහත කරුණු යටතේ විස්තර කර ඇත. (ගුණතිලක, ජී. 2004).

1. ආර්ථිකය ප්‍රධාන වශයෙන් අපනයන අංශය මත පදනම් වීම නිසා කෙටිකාලිනව සිදුවන උච්ජාවචනයන් සහ දිගුකාලිනව වෙළඳ ශේෂය පිරිහීම.

2. දේශපාලන අරමුණ සඳහා සුභ සාධන කටයුතු සිදු කිරිමෙන් සමාජ අරමුණ සහ ආර්ථික වර්ධනය ලඟාකර ගැනීම පිළිබඳ ගැටළු ඇතිවීම.

3. ගෙවුම් ශේෂ හිඟය සහ අයවැය හිඟයක් පවතින තත්ත්වයක් යටතේ සැලසුම් මගින් ආයෝජන වැඩිකිරිමට උත්සාහ කිරිම සාර්ව ආර්ථික කළමනාකරණය තුළින් කලයුත්තකි. එහෙත් එවැන්නක් කිරිමට අපහසුවීම.

*ISBN 978-955-4563-72-8*

4. අධික ජනගහන වර්ධනය සහ උගත් තරුණ පරපුර අතර විරැකියාව වැඩිවීම වැනි උග්‍ර ප්‍රශ්න සඳහා සැලසුම් කරනය කෙසේ භාවිතා කල හැකිද? යන්න පැහැදිලි නොවීම.

5. රජයන් වෙනස්වීම හා එහි ප්‍රතිඵලයන් වශයෙන් සිදුවන ප්‍රතිපත්ති වෙනස්වීම

6. තරුණ අසහනය සහ ජාතිවාදී ගැටළුව නිසා දේශපාලන සහ ආර්ථික ඵලදායිතාව ගොඩ නැගීමට අපහසුවීම.

කෘෂි අංශය මෙන්ම කාර්මික අංශය දියුණුකිරීම සය අවුරුදු සංවර්ධන සැලැස්මේ ප්‍රධාන කාර්‍යයන් විය. ඒ අනුව සැලැස්ම සඳහා වැයකල මුදලින් 42% ක් කෘෂි අශයට වෙන් විය. මෙම සංවර්ධන වැඩසටහනේ සාර්ථකත්වය එම සැලසුම් ක්‍රියාත්මක කිරීම අධීක්‍ෂණය කිරීම සහ ඇගයීම අනුව සිදුවිය යුත්තක් වුවත් එය පැවති දේශපාලන හා ආර්ථික තත්ත්වයන් හමුවේ ඵලදායි ලෙස ඉටුවූ බවක් නොපෙනේ. එසේ නමුදු වසර 03කට පසු එනම් 1951 දී දකුණු හා නැගෙනහිර ආසියාතික රටවල ආර්ථික සංවර්ධනය සඳහා සැලසුම් කල කොළඹ ක්‍රමය(Colombo Plan) සමග සංවර්ධන කටයුතු ඒකාබද්ධ කළ අතර ඒ අනුව 1951 - 57 වශයෙන් සැලසුම් කාල ද වෙනස් කරන ලදී (කරුණාතිලක, එච්.එන්.එස්. 1986).

**සය අවුරුදු ආයෝජන වැඩ සටහන**

1954 / 55 සිට 1959 /60 දක්වා ක්‍රියාත්මක වූ සය අවුරුදු ආයෝජන වැඩ සටහන ලෝක බැංකු නියෝජිත කණ්ඩායමේ උපදෙස් මත සකස් කරන ලද ව්‍යාපෘති වැඩ සටහනක් වශයෙන් හැඳින්විය හැක. සය අවුරුදු වැඩ සටහනට සාපේක්ෂව මෙය සැලසුම් කල වැඩ සටහනක් වූ අතර එය සැලසුම් කාර්‍යාලයේ (Planning Secretariat) අධීක්‍ෂණය යටතේ ක්‍රියාත්මක විය. කාලින ගැටළු සහ ප්‍රමුඛතා මත තීරණය වූ සය අවුරුදු ආයෝජන වැඩ සටහන මගින් පවත්නා සම්පත් වලින් උපරිම ප්‍රතිඵල ලබා ගැනීම සඳහා ඉලක්ක කරන ලදී. ඒ අනුව ඇස්තමේන්තු ගත මුළු අයෝජන වියදම වූ රුපියල් මිලියන 2000 න් රුපියල් මිලයන 1400 ක් රජය රජය මගින් දැරීමට අපේක්‍ෂා කල අතර මිලියන 600 ක් විදේශ විනිමය වශයෙන් ලබාගැනීමට බලාපොරොත්තු විය. ලෝක බැංකු නියෝජිතයන්ගේ සැලැස්මට වඩා පුළුල් වැඩසටහනක්වූ මෙයට අවශ්‍ය ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවිය. මුළු වියදමෙන් 77% ක් පමණ කෘෂිකාර්මික ව්‍යාපෘති සඳහා වැය කල අතර 16% ක් පමණ සෞඛ්‍ය, අධ්‍යාපනය සහ නිවාස ව්‍යාපෘති සඳහා වැය කරන ලදී, පොදු පිරිවැය සඳහා අවධානය යොමුකරනු ලැබුවත් කාර්මික අංශයේ ව්‍යාපෘති සඳහා යොමුකරන ලද්දේ අඩු අවධානයකි. 1954 දී එවකට මුදල් ඇමති වූ ඩම්.ඩී.එච්. ජයවර්ධන මහතා විසින් ඉදිරිපත් කරන ලද මෙම වැඩසටහන ක්‍රියාත්මක කරනු ලැබුවේ 1956 බලයට පත්වූ මහජන එක්සත් පෙරමුණ රජය මගිනි. එවකට රටේ ඇති වූ ජාතික ගැටළුව සහ දේශපාලන අස්ථාවර භාවය නිසා වැඩ සටහන නිසිපරිදි ක්‍රියාත්මක නොවිය. මෙයට බලපෑ ප්‍රධානතම හේතුව වුයේ ව්‍යාපෘති ක්‍රියාත්මක කල දෙපාර්මේන්තු අතර සබඳතාවයක් නොතිබීමයි. එසේම සැලසුම් ක්‍රියාත්මක කිරීම සඳහා නිසි ආයතනික ව්‍යුහයක් නොමැති වීමද හේතුවක් විය (කොරයා, ජී 1975).

**1958 - 68 දස අවුරුදු සැලැස්ම**

ලොව පිළිගත් ආර්ථික විද්‍යාඥයන් පිරිසක් විසින් සකස් කරන ලද මෙය විස්තරාත්මක පුළුල් සැලැස්මක්විය. එහි මුලික අරමුණ වුයේ රැකියා ප්‍රමාණය වර්ධනය කිරීමයි. එනම් වැඩ කරන ශ්‍රම බලකාය වැඩි කිරීම හා සේවා වියුක්තිය හා ඌන සේවා නියුක්තිය අවම කිරීමයි. මීට අමතරව අනෙකුත් අරමුණු වුයේ ගෙවුම් ශේෂ හිඟය අඩු කිරීම,ජීවන මට්ටම ඉහල දැමීම,ආර්ථිකය විවිධාංගීකරණය කිරීම හා ආදායම් විෂමතාව අවම කිරීමයි. මෙම අරමුණු ඉටු කරගැනීමේ දී ප්‍රධාන ඉලක්කයන් කීපයක් විය.

1. දිගු කාලීන තුලිත වර්ධනයක් ඇති කිරීම. (කෘෂි කාර්මික අංශය හා කාර්මික අංශය සමව සංවර්ධනය කිරීම)

2. එක පුද්ගල ආදායම වැඩි කිරිම

3. ආර්ථික අවිනිශ්චිතාව අවම කිරිම

*ISBN 978-955-4563-72-8*

4. ආනයන ආදේශන කර්මාන්ත සඳහා සැලසුම් කිරීම

මේ අනුව ආර්ථික සංවර්ධන කාර්යයන් පහත සඳහන් අංශ යටතේ සැලසුම් කරන ලදී.

1. කාර්මික අංශය සංවර්ධන කිරීම

මෙමගින් මූලික අරමුණු 05ක් ඉටුකර ගැනීමට සැලසුම් කරන ලදී. සේවා නියුක්තිය වැඩි කිරීම දේශීය සම්පත් භාවිතය සහ ගෙවුම් ශේෂ හිඟය අඩු කිරීම මෙහි ප්‍රධාන කරුණු විය.

2. කෘෂි අංශය දියුණු කිරීම

කෘෂි අංශය දියුණු කිරීම තුළින් රාජ්‍ය අපේක්ෂා කල ප්‍රධාන අරමුණු 05 කි.ආහාර සුරක්ෂිතතාවය, සහතික කිරීම,ග්‍රාමීය ආදායම වැඩි කිරීම හා දිළිඳුකම අවම කිරීම මෙහිදි වැදගත් කරුණු වූ අතර මේ නිසාවේ. මුළු වියදමෙන් 24% ක් කෘෂි අංශයට වෙන්කරන ලදී. මුල්‍ය සැපසුම ක්‍රමවත් කර දේශීය ඉතිරි කිරීම වැඩි කිරීම. රාජ්‍ය හා පුද්ගලික අංශයේ සබඳතාවය වැඩි කිරීම අනෙකුත් අරමුණු විය.

සැලැස්ම සකස් කරනු ලැබු ජෝන් රොබින්සන් ප්‍රමුඛ විද්වතුන් විසින් වැනි ආර්ථික විද්‍යාඥයෝ මෝල්තස් ඩේවිඩ් රිකාඩෝ සහ ආතර් ලුවිස් යන සම්භාව්‍ය ආර්ථික විද්‍යාඥයන්ගේ ආර්ථික චින්තනය අනුව ජනගහන පාලනය කිරීම, නිර්බාධ වෙළඳාම ඇති කිරීම සහ ග්‍රාමීය හා නාගරික අංශ අතර තුලිත සංවර්ධනයක් ඇති කිරීමට අපේක්ෂා කරන ලදී. හැරඩ් ඩෝමාර් ආකෘතිය අනුව ප්‍රාග්ධන සම්පාදනය ඉහල නංවා ආර්ථික වර්ධනය ඉහල නැංවීමට මේ යටතේ අපේක්ෂා කරන ලදී.

**පස් අවුරුදු සැලැස්ම**

සිරිමාවෝ බණ්ඩාරනායක ප්‍රමුඛ සමගි පෙරමුණු ආණ්ඩුව විසින් 1972- 77 කාලය සඳහා ක්‍රියාත්මක කල මෙම සැලැස්මේ ප්‍රධාන අරමුණු 3ක් විය.

1. දළ දේශීය නිෂ්පාදිත වර්ධන අනුපාතය වාර්ෂිකව 6% ක වට්ටමකින් පවත්වාගෙන යාම.

2. අටලක්ෂ දහදාහකට රැකියා සැපයීම.

3. අපනයන විවිධාංගීකරණය කිරීම.

මෙම අරමුණු ඉටුකර ගැනීම සඳහා අනුගමනය කල ප්‍රධාන උපාය මාර්ග 3ක් විය. ඒ අනුව

- දේශීය ඉතිරි කිරීමේ අනුපාතය 12% සිට 17% දක්වා වැඩි කිරීමටත්
- දේශීය ආයෝජන අනුපාතය19% දක්වා වැඩි කිරීමටත්
- ගෙවුම් ශේෂ හිඟය අඩු කිරීමටත් පියවර ගනු ලැබීය.

1975 වන විට ගෙවුම් ශේෂයේ පුනරාවර්තන හිගය රුපියල් මිලියන 468 ක් වූ අතර එය රු. මි.265 දක්වා අඩු කිරීමට සැලසුම් කලහ. ගෙවුම් ශේෂ හිඟය පාලනය කිරීම සඳහා ආනයන සීමා කිරීම සහ විවිධ ආනයන අදේශන ක්‍රම ක්‍රියාත්මක කරනු ලැබිය.

ආනයන ආදේශනය හා අපනයන විවිධාංගීකරණයට යොමු වීම මගින් පිටරටින් ආනයනය කල හාල්, පරිප්පු අඩු කල අතරඒ වෙනුවට වියළි කලාපයේ වැඩියෙන් මේ ආනයනික භෝග වගාකිරීමට පියවර ගනු ලැබීය. රජය ක්‍රියාත්මක කළ“ආහාර සංග්‍රාමය”වැඩ සටහන මගින් සෑම වගා නොකල ඉඩමක්ම වගා කිරීමට පියවර ගනු ලැබීය. සහල් පිටරට ගෙනයාම පමණක් නොව රටතුළ ගෙනයාම තහනම් කළ අතර බොහෝ ආනයනික භාණ්ඩ දේශීය වශයෙන් නිෂ්පාදනය කිරීම ආරම්භ කළහ.

සැලසුම් ක්‍රියාත්මක කිරීමේදී ජනතා සහභාගිත්වය ලබා ගැනීම. (Participatory Development) අපේක්ෂා කරනු ලැබීයමෙම උපාය මාර්ගයේ අරමුණ වුයේ GDP වර්ධනය 6% කින් වැඩි කිරීමයි). ප්‍රාග්ධන සුක්ෂම නිෂ්පාදන අඩුකර උපරිම ලෙස ශ්‍රම සුක්ෂම ක්‍රම භාවිතා කිරීමටද සැළැස්ම මගින් අදහස් කරන ලදී(Ministry Of Finance and Planning, 1978).

***ISBN 978-955-4563-72-8***

ආවෘත ආර්ථික ප්‍රතිපත්තිවල බලපෑම

සමස්ථයක් වශයෙන් 1948 සිට 1977 දක්වා ක්‍රියාත්මක වූ ආවෘත ආර්ථික ප්‍රතිපත්තිවල බලපෑම වර්ධන වේගය වැඩකිරීම, සේවා වියුක්තිය අඩු වීම සහ ජීවන මට්ටම ඉහලයාම යන දර්ශක යටතේ සිදුකල හැක. සෑම සැලසුමක් මෙන්ම ආයෝජන වැඩ සටහන් වලින් අපේක්‍ෂා කල පරිදි 6% ක ආර්ථික වර්ධන වේගයක් පවත්වාගෙන යාමට නොහැකි වූ අතර ප්‍රධාන ගැටළුව වූ සේවා වියුක්තිය අවම කිරීමටද ඵලදායි විසඳුමක් ලබාගත නොහැකි විය. සමාන්‍ය ආර්ථික වර්ධන වේගය අදාල 1948 - 1977 කාල සීමාවේදි 3% කට අඩුවෙන් පැවති අතර සේවා වියුක්තිය 15% ඉක්මවා පැවති බව මහබැංකු වාර්තා වලින් පෙන්නුම් කරයි. එසේම දේශීය කර්මාන්ත අංශය දියුණු කිරීමට ක්‍රියාත්මක වූ ආනයන ආදේශන ප්‍රතිපත්තිය මගින් ද වඩාත් කාර්යක්‍ෂම ලෙස සම්පත් බෙදී යාමත් හෝ සේවා වියුක්තිය අඩු විමක් සිදු වී නොමැත. පෞද්ගලික අංශ සහභාගිත්වය අඩුවිම, රාජ්‍ය ආයතනවල ආකාර්ක්‍ෂමතාවය, දියුණු තාක්‍ෂණක්‍රම භාවිතා නොකිරිම සාර්ව ආර්ථික කලමනාකරණය දුර්වලවීම සහ රාජ්‍යයන් මාරුවිම නිසා දේශපාලන දර්ශනය වෙනස්විම වැනි කරුණු සැලැසුම් වලින් අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීමට අපහසු වූ අතර එමනිසා සැලසුම් ක්‍රියාත්මක කිරිමෙන් ආර්ථිකයට බලපෑමක් සිදු නොවූ බව පෙනේ.

අපේක්‍ෂිත පරිදි සංවර්ධන ඉලක්කයන් ලඟාකර ගැනීමට සංවර්ධන සැලසුම් වලින් හැකිවුයේ නම් කෙටිකලකින් ශ්‍රී ලංකාව නව කතාර්මික රටක් බවට පත් කිරීමට හැකියාව තිබිනි. එයට හේතුව වන්නේ 1948 වනවිට දකුණු ආසියාවේ ශක්තිමත් ආර්ථිකයක් වශයෙන් අතිරික්ත වෙළඳ අනුපාතයන් පවත්වාගෙන ගිය රටක් වශෙයෙන් අපනයන ආදායම සම්පූර්ණයෙන්ම සංවර්ධනයට සහ ආයොජනයට වැය කල හැකිව තිබු නිසයි. එසේ නමුත්දැඩි ලෙස ආනයන මත රඳා පවතින රටක් වශයෙන් අපනයන ආදායම ආහාර සහ අනෙකුත් අතවශ්‍ය භාණ්ඩ සඳහා වැය කරනු ලැබිය. එමනිසා ඌන සංවර්ධන රජයක් වශයෙන් දශක ගණනාවක් තිස්සේ ආර්ථික අභියෝග රැසකට මුහුණදීමට ශ්‍රී ලංකාවට සිදුවිය. එහි ප්‍රතිඵලයක් වශයෙන් විදේශ ණය ලබා ගැනීමට සිදුවු අතර විදේශ ණය බර ක්‍රමයෙන් වැඩිවිය. වර්තමානය වනවිට රජය උපයන සෑම රුපියලකින් ශත 90ක් ණය ගෙවිමට සිදුවී ඇත. මෙම තත්ත්වයන් තුල විදේශ වෙළඳාම සහ විදේශ ආයෝජනය මත පදනම් වූ වෙළඳ ආර්ථික ප්‍රතිපත්ති කෙරෙහි අවධානය යොමු කිරිමට 1977 න් පසු බලයට පත් රජයන් විසින් පියවර ගනු ලැබිය.

**විවෘත ආර්ථික ප්‍රතිපත්ති යුගය ( 1977 - 2004)**

විවෘත හෝ නිදහස් ආර්ථික ප්‍රතිපත්තියක් යනු ආර්ථික කටයුතු වලින් රාජ්‍ය මැදිහත් වීම අවම කර මිළ යාන්ත්‍රණය මගින් ඉල්ලුම හා සැපයුම බලාවේග අනුව වෙළඳපල ක්‍රියාකාරිත්වය ඇති කිරිමයි. ඒ අනුව රටක ආර්ථික ක්‍රියාවලියට සම්බන්ධ නිෂ්පාදනය, මිළ, වෙළඳාම. මුල්‍ය හා වෙළඳපල කටයුතු රාජ්‍ය මැදිහත්විමකින් තොරව ඉල්ලුම් සැපයුම් බලවේග අනුව තීරනය වීමට ඉඩ හැරීම නිදහස් ආර්ථික ප්‍රතිපත්ති වශයෙන් සැලකේ. 1977 ට පෙරත් විටින් විට ශ්‍රී ලංකාවේ පැවති රාජ්‍යයන් විසින් නිදහස් ආර්ථික ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරනු ලැබුවත් පුර්ණ ලෙස ආර්ථික කටයුතු නිදහස් කරණය (Liberalization) හා නියාමන හරණය(Dergulation) කරනු ලැබුවේ 1977න් පසුව නිසා 1977 න් පසු කාලය නිදහස් ප්‍රතිපත්ති යුගය වශයෙන් සැලකිය හැක. මෙම යුගය දශක 3කට වැඩි අතර අරමුණු, ප්‍රතිපත්ති, ක්‍රමෝපායන් සහ ක්‍රියාකාරිත්වය අනුව නිදහස් ආර්ථික ප්‍රතිපත්ති යුග 3 ක් හඳුනාගත හැකිය (සෝමරත්න 2002, ප්‍රනාන්දු 2009). එසේ නමුදු 2004 සිට 2014 දක්වා ක්‍රියාත්මක වූ මහින්ද චින්තන යුගය වෙන් වශයෙන් සලකා බැලීමේ දි ප්‍රධාන යුග 4ක් වශයෙන් හඳුනාගත හැක.

1. 1977 සිට 88 දක්වා යුගය

2. 1989 සිට 1994 දක්වා යුගය

3. 1994 - 2004 දක්වා යුගය

4. 2004 සිට 2014 දක්වා ක්‍රියාත්මක වූ මහින්ද චින්තන යුගය

**2.1 1977 - 1988 යුගය**

*ISBN 978-955-4563-72-8*

1977 බලයට පත් රජය විසින් ක්‍රියාමාර්ග ගණනාවක් ගන්නා ලදී (ගුණතිලක ජී.2004). සම්පත් බෙදාහැරීම කාර්යක්ෂම කිරීම මගින් රාජ්‍ය ආයෝජන වැඩි කිරීමට අපේක්ෂා කල අතර ඒ සඳහා පුද්ගලික අංශය දිරිමත් කරනු ලැබිය. ඒ අනුව වෙළඳපල බලවේග ක්‍රියාත්මක වීමට ඉඩ සලසමින් ඒ සඳහා රජයේ මැදිහත්වීම අඩු කිරීම, ද්විත්ව විනිමය අනුපාත අහෝසිකොට නම්‍ය විනිමය අනුපාත ක්‍රමයක් හඳුන්වා දීම, ආනයන මත පනවා තිබූ ප්‍රමාණාත්මක සීමා කිරීම් වෙනුවට තීරුබදු ක්‍රමය ක්‍රියාත්මක කිරීම. විදේශ විනිමය ගණුදෙනු සඳහා පනවා තිබූ බදු ඉවත් කිරීම, මුල්‍ය වෙළඳපල ලිහිල් කිරීම හා පොළී අනුපාත ඉල්ලුම හා සැපයුම අනුව සැකසීම හා ඍජු විදේශ ආයෝජන සඳහා පෙළඹවීමට වැනි ක්‍රියාමාර්ග මෙහිදී ප්‍රධාන වේ (කරුණාතිලක එච්.එන්.එස්. 1987). මෙම ක්‍රියාමාර්ග තුලින් එවකට පැවති රජය අපේක්ෂා කරනු ලැබුවේ විවෘත ආර්ථික ප්‍රතිපත්ති හඳුන්වාදීමය. මෙය විස්තීරණ ආර්ථික ප්‍රතිසංස්කරණ යෝජනා වලිය වශයෙන් හඳින්වූ අතර එය ප්‍රධාන කොටස් 2කින් යුක්තය (ප්‍රනාන්දු, එම්. 2009).

1. නිදහස් ආර්ථික ප්‍රතිපත්ති (liberalization Policies)

2. නියාමන හරන ප්‍රතිපත්ති (Deregulation Policies):පාලන නීති ලිහිල් කිරීම සහ සීමා කිරීම අවම කිරීම

මේ සඳහා ජාත්‍යන්තර මුල්‍ය අරමුදලේ උපදෙස් හා ණය පහසුකම් සපයන ලදී. ඒ අනුව ගෙවුම් ශේෂ හිඟය අඩුකිරීම හා විදේශ සංචිත ප්‍රමානය වැඩි කිරීම සඳහා අරමුදල මගින් සම්පස්ථ ණය පහසුකම් සපයන ලදී. මේ යටතේ 1977 දී SDR දශලක්ෂ 93ක්ද 1983 දී SDR දශ ලක්ෂ 100 ක් හා 2003 දී SDRදශලක්ෂ 200ක්ද සපයන ලදී. වර්තමානය වන තුරුම රටේ විදේශ සංචිත අගය අඩුවන විට ජාත්‍යන්තර ණය අරමුදලේ සම්පස්ථ ණය පහසුකම ලබාගැනීම සෑම රජයක්ම විසින්ම සිදු කරනු ලබන්නකි. ඒ අනුව 2010 හා 2011 වැඩවලදී ද අවකට පැවති රජය විසින් විවිධ කොන්දේසි යටතේ මෙම ණය පහසුකම් ලබා ගන්නා ලදී. මෙලෙස 1977 සිට ක්‍රියාත්මක කල විවෘත ආර්ථික ප්‍රතිපත්ති ප්‍රධාන අංග 5ක් යටතේ විස්තර කල හැක. (Gunawardena, P.J. and Somaratne, W.G.2000).

1. මිල ප්‍රතිපත්ති (Price Policy)

ඉල්ලුම සහ සැපයුම අනුව වෙළඳපල මිල තීරණය වන අතර රාජ්‍ය මැදිහත්වීමක් සිදු නොවේ. අධි සැපයුමක් හෝ භාණ්ඩ හිඟයක් පවතින අවස්ථා වලදී පමණක්ස්වාරක්ෂක තොග පවත්වා ගැනීම වැනි ක්‍රම මගින් රජය වෙළඳපල මිල පාලනය කරනු ලැබිය. ඒ අනුව දේශිය වෙළඳපල භාණ්ඩ හා සේවා මිල ඉල්ලුම් - සැපයුම් තත්ත්වයන් මත පදනම් විය. එනමුදු ආනයනික භාණ්ඩ සඳහා තීරුබදු පැනවීම හෝ කොටා ක්‍රම මගින් මිළ පාලනය කිරීමට රජය කටයුතු කරනු ලැබීය. එසේම රාජ්‍ය සහනාධාර සහ සහතික මිල ක්‍රමය මගින් නිෂ්පාදකයා ආරක්ෂා කිරීමට රජය විටින්විට ක්‍රියාකාරීවීමෙන් වෙළඳපල මිල විකෘති වුවද සමතුලිත මිලක් පවත්වා ගෙනයෑමට කටයුතු කරනු ලැබීය.

2. වෙළෙඳ ප්‍රතිපත්ති (Trade Policy)

විදේශ හා දේශිය වෙළඳාම සඳහා පනවා තිබූ තහංචි සහ බාධා ඉවත් කිරීම මේ යටතේ සිදුවිය. සාපේක්ෂ වාසි න්‍යාය මත ජාත්‍යන්තර වෙළඳාම තීරණය වන අතර ඒ අනුව උපරිම සාපේක්ෂ වාසි ඇති භාණ්ඩ නිෂ්පාදනය කොට අපනයනය කිරීමටත් සාපේක්ෂ වාසිය අඩු භාණ්ඩ නිෂ්පාදනය නොකොට ආනයනය කිරීමටත් කටයුතු කරන අතර තීරුබදු පැනවීම මගින් වෙළඳ අවාසි මගහරිනු ලැබේ. ඒ අනුව ආනයන ආදේශන ප්‍රතිපත්තිය වෙනුවට අපනයනභිමුඛ වෙළඳාමක් සිදු කෙරේ. නිදහස් වෙළඳාම යටතේ උපරිම නිෂ්පාදන සහ සුභ සාධන වාසි අත්කර ගැනීමෙන් ආර්ථික වර්ධනයට හේතුවන බව න්‍යායත්මකව පෙන්නුම් කරන අතර ඒ අනුව වෙළඳ විවෘත භාවය වැඩි කිරීමට ලක් රජය පියවර ගනු ලැබීය.

3. විනිමය සහ මුල්‍ය ප්‍රතිපත්ති

විදේශ විනිමය සීමා කිරීම් සහ විදේශ විනිමය ගණුදෙනු සඳහා තිබූ බදා ඉවත් නරන ලද අතර විදේශිය බැංකු ශ්‍රී ලංකාවේ ඇරඹීම සඳහා සානුබල සපයන ලදී, ඉල්ලුම සහ සැපයුම අනුව මුදලේ අගය තීරණය වීමට කටයුතු කලඅතර ඒ අනුව ස්ථාවර විනිමය අනුපාත ක්‍රමය වෙනුව නම්‍ය හා

***ISBN 978-955-4563-72-8***

පාවෙන විනිමය අනුපාත ක්‍රමයත් හඳුන්වාදෙන ලදී. 1976 සිට ක්‍රියාත්මක කල වැනි ද්විත්ව විනිමය අනුපාත ක්‍රම පසුව අහෝසි කරන ලදී.

4. රාජ්‍ය මුල්‍යසහ අයවැය ප්‍රතිපත්ති (Fiscal Policy)

රාජ්‍ය බදු ආදායම ලබා ගන්නා ප්‍රතිපත්තින් වඩාත් නම්‍යශිලි සහ ඵලදායි අන්දමින් ක්‍රියාත්මක කිරිමට අපේක්ෂා කල අතර සෘජු සහ වක්‍ර බදු දෙයාකාරයෙන්ම රාජ්‍ය ආදායම වැඩි කිරිමට පියවර ගනු ලැබිය. මේ යටතේ බදු විරාම සහ බදු සහන සපයනු ලැබිය. එසේම සංකීරණ බදු ක්‍රමය සරල බදු ක්‍රමයක් බවට පත් කිරිමට කලින් කල පියවර ගන්නා ලදී.

5. ආයතනික ප්‍රතිපත්ති

රාජ්‍ය ආයතනික ව්‍යුහය පෞද්ගලිකරණයට හිතකර වන ආකාරයට ප්‍රතිපත්ති සකස් කිරිමට මෙමගින් අපේක්ෂා කල අතර ඒ අනුව රාජ්‍ය නීති රීති ලිහිල් කිරිම සහ නිළධාරිවාදය අවම කිරීමට පියවර ගනු ලැබීය. පෞද්ගලික ව්‍යවසායකයන්ට පොදු කාර්යසේවා සහ ණය පහසුකම් ලබාදීම සඳහා මේ යටතේ පියවර ගනු ලැබීය.

**1989 - 1994 දක්වා යුගය**

ආර්ථික කටයුතු තවදුරටත් ලිහිල්කරණය කල මෙම කාලයේ වැඩි අවධානයක් යොමු කරනු ලැබුවේ ව්‍යුහාත්මක ගැලපුම් අනුව ආර්ථිකය වඩාත් නිවැරදි ලෙස නිදහස්, ආර්ථික ප්‍රතිපත්ති අනුව ක්‍රියාත්මක කරවීමයි. ජාත්‍යන්තර මුල්‍ය අරමුදලේ සහ ලෝක බැංකුවේ උපදේශ මත ක්‍රියාත්මක කරනු ලබන මෙම යෝජනා මගින් පෞද්ගලික අංශය වර්ධනයේ යන්ත්‍රණය වශයෙන් සැලකු අතර රාජ්‍ය අංශය ආර්ථික නියාමනය කිරීම සහ පොදු කාර්යය සේවා සැපයිම සඳහා පමණක් කටයුතු කල යුතු විය. මේ අනුව පුද්ගලිකරණය කිරීම මෙම ප්‍රතිපත්ති මුලයේ ප්‍රධාන අංගයක් වූ අතර පාඩු ලබන රාජ්‍ය ආයකන පුද්ගලික අංශයට පවරාදීම ඒ යටතේ සිදුවිය. එමගින් රාජ්‍ය සේවක සංඛ්‍යාව අඩුකිරිමටත් ක්‍රමයෙන් පුද්ගලික අංශයේ සේවක ප්‍රමාණය වැඩිකිරිමටත් පියවර ගනු ලැබිය. මීට අමතරව මුදලේ අගය අවප්‍රමාණය කිරිම බැංකු පොලි අනුපාත වෙනස්කිරිම සහ ආනයන සඳහා නාමික තීරුබදු පැනවීම වැනි ක්‍රියාමාර්ග යෝජනා කරන ලදී, 1987 සිට ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක කල මෙම ප්‍රතිපත්ති මගින් විශාල රාජ්‍ය ආයතන ප්‍රමාණයක් පෞද්ගලික අංශයට පවරන ලදී, උදා. පිඟන් කර්මාන්ත ශාලාව, හිගුරාන සීනි කර්මාන්තය, කඩදාසි කර්මාන්තය, රෙදිපිලි කර්මාන්තය, සිමෙන්ති සහ රාජ්‍ය ඉස්කාගාර සංඛ්‍යාව වැනි ආයතන පුද්ගලික අංශයට විකුණන ලදී, එහි සේවක සංඛ්‍යාවට ක්‍රම ක්‍රමයෙන් වන්දි ගෙවා ඉවත් කරන ලදී, එසේම අවස්ථා ගණනාවකදීම රුපියලේ අගය අවප්‍රමාණය කරන ලදී. ඒ අනුව ඇමෙරිකානු $1 එකට රුපියල් 60 ක් වු මුදලේ අගයවර්තමානය වන විට $1 = රු. 143/= ක් අඩුවී ඇත. එලෙස මුදල අවප්‍රමාණය විම රටේ උද්ධමනයට බලපා ඇත. විනිමය අනුපාත වෙනස්කිරිම තුලින්ද ආනයන වියදම වැඩිවී අපනයන ආදායම වැඩිවී ඇත(Central Bank of Sri Lanka,2012).

නව ලිබරල්වාදී ප්‍රතිපත්ති අනුව ව්‍යුහාත්මක ගැලපුම් ප්‍රතිපත්ති ලොව සංක්‍රාන්ති රටවල මෙන්ව නව කාර්මික රටවල් මගින්ද ක්‍රියාත්මක කෙරේ. මෙය වර්තමානයේ IMF මගින් දියුණු වන රටවල් සඳහා නිර්දේශිත ප්‍රතිපත්තිමෙවලටත් බවට පත්ව ඇත. එහිදි විශේෂයෙන්ම අවධාරණය කරුණු ලැබුවේගෙවුම් ශේෂ හිගය අඩුකිරීමට කටයුතු කිරිම,දේශිය මුදලේ අගය අවප්‍රමාණය කිරිම,රාජ්‍ය ක්‍රියාකාරිත්වය සහ රාජ්‍ය සේවා පිරිවැය අඩුකිරිම, පුද්ගලිකරණය කිරිම,ආනයන සඳහා තීරුබදු අඩුකිරීම, දැඩි මුල්‍ය ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවීම,නිදහස් වෙළඳාම වැඩි කිරිම,සමාජ වියදම් අඩුකිරිම සහ ව්‍යාපාර නියාමන හරනය කිරිම සඳහා අනුබල දීමයි(Henegedara, G.M. 2003).

**1994 - 2004 දක්වා යුගය**

මෙම කාලසීමාව තුල ක්‍රියාත්මක කල ආර්ථික ප්‍රතිපත්තිවල ඉලක්කය වුයේ 1977 සිට හඳුන්වා දුන් ප්‍රතිපත්ති වල සැඟවුණ විෂමතා සහ විකෘතිතා ඉවත් කිරිමයි. මේ අනුව ඉඩම්, හා දේපල සම්බන්ධ නිතිරිති වෙනස් කිරිමට අවධානය යොමුකල අතර ඉඩම්වල වටිනාකම අනෙකුත් භාණ්ඩවල මෙන් වෙළඳපල වටිනාකම අනුව තීරනය විය යුතු බවට ප්‍රකාශ කරන ලදී. මෙම කාලයේදී රාජ්‍ය ප්‍රතිපත්තියේ ප්‍රධාන ලක්ෂණය වුයේ ව්‍යාපාරික හිතවත් පරිසරයක් ඇතිකොට පුද්ගලික අංශයේ

*ISBN 978-955-4563-72-8*

සහභාගිත්වය වැඩි කිරිමයි. විශේෂයෙන්ම කොටස් වෙළඳපල වර්ධනය, පෞද්ගලික අංශය, කෘෂි අංශයට දක්වන දායකත්වය වැඩිකිරිම එහිදි අවධාරනය කරන ලදී, ඒ අනුව පහත සඳහන් ක්‍රියාමාර්ග අනුගමනය කරනු ලැබීය(Central Bank of Sri Lanka,2002).

1.) කෘෂි ක්ෂේත්‍රය සම්බන්ධ පැවති අවදානම හා සැඟවුනු විෂමතා අවමකිරිමට කටයුතු කිරිම.

2.) ව්‍යාපාරික කටයුතු වලට රජය මැදිහත්වීම තවදුරටත් අඩු කිරීම.

3.) රාජ්‍ය ව්‍යාපාරවල ඒකාධිකාරි තත්ත්වයන් අඩු කිරීම (උදාහරණ දුම්රිය හා පොදු ප්‍රවාහනය)

4.) ඉඩම් අයිතිය සඳහා හිමිකම් සහතික පත්‍ර නිකුත් කිරීම.

සත්‍ය ලෙසම මෙම කාල වකවානුව තුලදී ද සිදුවූයේ තවදුරටක් ව්‍යුහාත්මක ගැලපුම් ක්‍රම ආර්ථිකයට හඳුන්වා දීමයි. දේශීය සංචිත ප්‍රමානය අඩුවිම නිසා නිරන්තරයෙන්ම අධික පොලියට ණය ලබාගැනීමට කටයුතු කරන විට සුභ සාදන වියදම් අඩුකිරිමටසිදුවේ.ලෝක බැංකුව විසින් දෙනු ලබන උපදෙස් පිළිපැදීමට රජය බැඳි සිටින අතර කොතරම් අපහසු වුවත් එම තත්ත්වය වෙනස් කිරිමට රජයට අපහසු වී ඇත. මේ නිසා ගෝලිය ආර්ථිකය හා බැඳුනු ප්‍රතිපත්තියක් අනුගමනය කිරිමට රජයට සිදුවීය(Fernando, M. V. M. 2009).

## මහින්ද චින්තන වැඩ සටහන (2006 - 2016)

2004 වර්ෂයේ සිට 2014 දක්වා ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වූ ප්‍රතිපත්ති රාමුව ලිහිල්කරණය සහ රාජ්‍ය මැදිහත්වීම් දෙකේම සංකලනයක් වශයෙන් සැලකිය හැක. මෙය මහින්ද චින්තන ප්‍රතිපත්තිය වශයෙන් සලකන අතර එය 2004 ජනාධිපතිවරණයේදී පොදුජන එක්සත් පෙරමුනේ අපේක්ෂක මහින්ද රාජපක්ෂ මැතිතුමා ඉදිරිපත් කල ප්‍රතිපත්ති ප්‍රකාශය විය. පසුව එය රජයේ ප්‍රතිපත්ති රාමුව වශයෙන්ද ක්‍රියාවට නංවන ලදී. දකුණු කොරියාව සහ චීනය වැනි ඉතා වේගයෙන් දියුණුවන රටවල වර්ධන ආකෘතින් අනුගමනය කරමින් අපනයනාභිමුඛ ප්‍රතිපත්ති රාජ්‍ය නියාමනය යටතේ ක්‍රියාත්මක කරවීමට තැත්කරනු ලැබිය. ඒ අනුව පුද්ගලිකරණය කිරීමට අපේක්ෂා කරන ලද ඇතැම් රාජ්‍ය ආයතන මහජන චීනයේ මෙන් වඩාත් කාර්‍යක්ෂම රාජ්‍ය යන්ත්‍රනයක් යටතේ තරගකාරි මට්ටමින් ක්‍රියාත්මක කරවිමට අපේක්ෂා කරනු ලැබිය. ඒ අනුව ශ්‍රී ලංකා දුම්රිය සේවය, එයාර් ලංකා සහ ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය වැනි ආයතන ප්‍රතිව්‍යුහ ගතකර රාජ්‍ය අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක කරනු ලැබීය. මහින්ද චින්තනයේ අරමුණු සහ ඉලක්ක ලඟාකර ගැනීම සඳහා භාවිතා කල උපක්‍රම කීපයකි.

1) යැපුම් කෘෂි අංශය කෘෂි කර්මාන්ත පදනම් කරගත් ඉහල ඵලදායි අංශයක් බවට පරිවර්තනය කිරිම.

2) නිෂ්පාදනය, ඵලදායිතාවය සහ තරගකාරිත්වය වැඩි කිරිම.

3) ශ්‍රමය, ඉඩම් (භූමිය) සහ අනෙකුත් නිෂ්පාදන සාධකවල ඵලදායිතාවය ඉහල නැංවිම.

4) යාන්ත්‍රිකරනය සහ තාක්ෂණික පරිවර්තනය මගින් නිෂ්පදන කාර්‍යක්ෂමතාවය වැඩි කිරිම.

5) වෙළඳපල යන්ත්‍රනය දියුණු කිරිම.

එම නිසා දිගුකාලින සංවර්ධන වැඩ පිළිවෙලක් ලෙස ඉතා පැහැදිලි දැක්මක් සහිතව ආර්ථිකය කළමනාකරණය කිරීමේ අරමුණින් මහින්ද චින්තන ප්‍රතිපත්ති රාමුව ඉදිරිපත් කරනු ලැබීය(Government Press, 2004, 2010) . වැඩිවන ජනගහනයට රැකියා සැපයීම හා ග්‍රාමීය දිළිඳුකම අවම කිරිම සඳහා මේ සැලැස්මේ ප්‍රධාන අවධානය යොමු විය. ජාතික ආදායම ඉහල නංවා වර්ධන අනුපාතය ඉහල නැංවීමට පමණක් නොව දිළිඳුකම හා ආදායම් විෂමතාව අවම වන පරිදි තිරසාර සංවර්ධනයක් ඉලක්ක කිරීමත් මේ ප්‍රතිපත්තියේ මුලික ඉලක්කයන් විය. එනම් ආර්ථික වර්ධනය පමණක් නොව තිරසාර සංවර්ධනය අපේක්ෂා කර ඇත. මේ අනුව ඒක පුද්ගල ආදායම 2016 වන

*ISBN 978-955-4563-72-8*

විට ඇමරිකානු ඩොලර් 4000 දක්වා ඉහල නංවා ශ්‍රී ලංකාව ඉහල මධ්‍යම ආදායම් ලබන රටක් බවට පත් කිරිමට අරමුණ විය.

**මහින්ද චින්තනය ඉදිරි දැක්ම - 2010 අළුත් ශ්‍රී ලංකාවක් සුභ අනාගතයක්**

2004 ජනාධපතිවරනයේදී ඉදිරිපත් කල මහින්ද චින්තන වැඩ පිළිවෙල තව දුරටත් පුළුල් පරමාර්ථ සහ පැහැදිල් දැක්මක් සහිතව අළුත් ශ්‍රී ලංකාවෙක් සුභ අනාගතයක් යන තේමාව යටතේ 2010 ජනාධිපතිවරනයේ දී ඉදිරිපත් කල අතර ජනාධිපතිවරණ ජයග්‍රහනයෙන් පසුව රජයේ ප්‍රධාන සංවර්ධන දැක්ම වුයේ ශ්‍රී ලංකාව ආසියාවේ ආශ්චර්ය බවට පත්කිරිමයි. ඒ අනුව අනෙකුත් මතුවෙන් පවත්නා ආර්ථිකයක් සහ නව කාර්මික රටවල් මෙන් ඉතා ඉහල ආර්ථික වර්ධන අනුපාතයක් සහිතව ශ්‍රී ලංකාව ආසියාවේ ආශ්චාර්ය බවට ගෙන ඒමට ඒ අනුව කටයුතු කරනු ලැබීය. මහින්ද චින්තනය 2010 - ඉදිරි දැක්ම හා වැඩ පිළිවෙල ප්‍රධාන කරුණු 15 ක් යටතේ ඉදිරිපත් කරඇත (මහින්ද චින්තන ඉදිරි දැක්ම 2010).මින් ප්‍රධාන කාර්‍යය වුයේ පංචබල කෙන්ද්‍රයන් ඇසුරෙන් ශ්‍රී ලංකාව ආසියාවේ ආශ්චාර්ය බවට පත් කිරිමයි. එනම් ගෝලිය වශයෙන් වැදගත් ආර්ථික මධ්‍යස්ථානක් කිරිමට කටයුතු කිරීමයි.ඒ අනුව

1. නාවුක කෙන්ද්‍රයක් කිරීම, හම්බන්තොට වරාය ඉදිකිරීම,දකුණු කොළඹ වරාය දියුණු කිරිම, ගාල්ල සංචාරක වරායක් කිරීම, ඔලුවිල්, කන්කසන්තුරේ සහ ත්‍රිකුණාමලය වරායන් වල සංවර්ධන කටයුතු අවසන් කිරීමට මේ යටතේ යෝජිතය. මෙම කාර්‍යයන් මගින් ස්ථිර රැකියා අවස්ථා 50 000ක් ජනින කිරිමට අපේක්ෂිතය එසේම ලක්ෂ 3කට වක්‍ර රැකියා අවස්ථා සැපයිමටත් හම්බන්තොට වරාය කේන්ද්‍රකොටගත් ඇඹිලිපිටිය සහ තණමල්විල ප්‍රදේශවලත් ත්‍රිකුණාමලය, ඔලුවිල් සහ කන්කසන්තුරේ වරායවල් අවට ආර්ථික කලාප 4ක් පිහිටුවීමටත් අපේක්ෂා කරනු ලැබීය.එසේම නාවික භාණ්ඩ ප්‍රවාහන ගම්මානයක් (Cargo Village) පැලියගොඩ පිහිටුවීම ද යෝජිතය.

2. ගුවන් කේන්ද්‍රස්ථානයක් ඇති කිරිම: මේ යටතේ අපේක්ෂිත කාර්‍යයන් වුයේ

- ශ්‍රී ලංකාවේ දෙවන ජාත්‍යන්තර ගුවන් තොටුපල මත්තල පිහිටුවීම, කටුනායක ගුවන් තොටුපල නවීකරණය කිරිම හා පලාලි, අම්පාර හා රත්මලාන අභ්‍යන්තර ගුවනතොටුපල වැඩි දියුණු කිරිමයි. මෙමගින් 5000කට පමණ සෘජු රැකියා හා 15,00කට වක්‍ර රැකියා සැපයීමට අපේක්ෂා කෙරිනි.

3. වාණිජ කේන්ද්‍රස්ථානයක් කිරිම

ශ්‍රී ලංකාව බැංකු, වාණිජ සේවා සහ ජාත්‍යන්තර ආයෝජන සිදුකරන ආසියාවේ මධ්‍යස්ථානයක් බවට පත් කිරිම.

4. බලශක්ති කේන්ද්‍රයක් කිරිම(Energy Hub)

මේ යටතේ අපේක්ෂිත කාර්‍යයන් වුයේ මන්නාරම තෙල් ලිඳ කැනිම, තෙල්, ගෑස් හා න්‍යෂ්ටික බලය සඳහා ඉන්ධනයන් වූ ඛණිජ වැලි සම්පත ඉදිරි දශකයේ දී මතුකර ගැනීම. නව තෙල් පිරිපහදු ඇති කිරිම හා තාප බලාගාර ඇති කිරිම.

5. දැනුමේ කේන්ද්‍රයක් බවට පත් කිරිම(Knowledge hub).

විශ්වවිද්‍යාල, කාර්මික විද්‍යාල ඇති කොට ද්විතියක අධ්‍යයන පාඨමාලාවල වෙනසක් ඇති කිරීමට මින් අපේක්ෂිතය මේ යටතේ අපේක්ෂිත සුවිශේෂි අරමුණු 05 ක් විය. තොරතුරු තාක්ෂණ සාක්‍ෂරතාව සැමට ලබා දීම,2. සියළු පුරවැසියනට අන්තර්ජාල පහසුකම් ලබාදීම,3. දැනුම පදනම් කරගත් රැකියා අවස්ථා සැලසීම,4. දේශිය නවොත්පාදන ඇති කිරීමහා5. අපනයන ඉපැයුම් වැඩි කිරීම.

මහින්ද චින්තන වැඩ සටහන යටතේ පසුගිය අට වසරක කාලය සඳහා කාර්ය සාධනය සලකා බලනවිට සැලැස්මේ මුලික ඉලක්කයන් වූ දිළිඳුකම අඩු කිරිම, ඒක පුද්ගල ආදායම දෙගුණ කිරිම,

***ISBN 978-955-4563-72-8***

ප්‍රාදේශීය විෂමතාවයන් අඩු කිරීම, ග්‍රාමීය පොදු කාර්ය සේවාවන් වැඩි කිරීම, දේශීය ආහාර නිෂ්පාදනය වැඩි කිරීම සහ විදුලි බලය සැපයීම වැනි කාර්යයන් වල ප්‍රගතියක් දැකිය හැක. ඒ අනුව සහස්‍ර සංවර්ධන ඉලක්ක වන දැක්වෙන පරිදි දිළිඳුකම අඩු කිරීම, අධ්‍යාපනය හා සෞඛ්‍ය සේවාවන් වර්ධනය කිරීමට හැකිවී ඇත. උතුරු නැගෙනහිර වාර්ෂික ගැටළුව නිරාකරණය කර ගැනීම සහ රටතුල දේශපාලන ස්ථාවරභාවය අත්කර ගැනීම තුලින් රජයේ සංවර්ධන වැඩ පිළිවෙල අඛණ්ඩව කරගෙන යාමට හැකියාව ලැබිණි. එසේම ග්‍රාමීය සහ නාගරික ප්‍රදේශ ආශ්‍රිතව මතුවෙමින් තිබූ විෂමතාවයක් අඩු කිරීමටද හැකිවී ඇත. ඒසේ නමුදු සාර්ව ආර්ථික කාර්ය සාධනය පිළිබඳව කරනු ඉදිරිපත් කරන ආචාර්ය සමන් කැලේගම ප්‍රකාශ කරනුයේ අධිවේග මාර්ග ඉදිකිරීම හා අනෙකුත් පොදු කාර්යයන් සේවා නිසා රටේ ජාතික ආදායම වැඩිවී ඇතත් එය ස්ථාවර ලෙස ජාතික නිෂ්පාදිතය වැඩිවීම සහ විදේශ වෙළඳාම දියුණුවීම නිසා සිදුවුවවක් නොවන බවයි (කැලේගම, එස්. 2014).

## ආර්ථික ප්‍රතිපත්තිවල බලපෑම

1948 සිට ක්‍රියයාවට නංවන ලද ආර්ථික ප්‍රතිපත්ති කොතෙක් දුරට ශ්‍රී ලංකා ආර්ථිකයේ කාර්ය සාදනය සහ ගමන්මග තීරණය කිරීම සඳහා බලපා ඇත් ද යන්න පුළුල් දෘෂ්ඨි කොණයකින් බැලිය යුතුය. එමනිසා මෙහි බලපෑම ධනාත්මක සහ සෘණාත්මක කෝණයන්ගෙන් බැලිය හැක. ශ්‍රී ලංකා ආර්ථිකයේ ප්‍රධාන කාර්යයසාධන දර්ශකයන් වන දළ ජාතික නිෂ්පාදනය, ඒක පුද්ගල ආදායම, වර්ධන අනුපාතය, ඉතිරි කිරීම්, ආයෝජනය, දිළිඳුකම, කෘෂි, කාර්මික හා සේවා අංශවල සංයුතිය වෙනස්විම වැනි දර්ශකයන් ධනාත්මකව වැඩි වී ඇති බව ලේඛන අංක 1න් පෙන්නුම් කෙරේ. මෙහි ප්‍රතිඵලයන් ලෙස මධ්‍යම ආදායම්ලාභි රටක් බවට පරිවර්තනය වීමට දශක 03 ක වැනි කාලයකින්හැකිවී ඇත. සේවා වියුක්ති අනුපාතය, උද්ධමනය සහ පොදු සේවා සැපයීම පාලනය කරගත හැකි මට්ටමක පවතී. 2007 වර්ෂයේ සිට ගෝලීය ආර්ථිකයේ ඇති වූ උච්චාවචනය වීම් ඉදිරියේ පවා පීඩනයට ඔරොත්තු දෙන මට්ටමට ආර්ථිකය පවත්වා ගැනීමට හැකිවිම වැදගත්ය. එනමුදු ගෝලීය ආර්ථික උච්චාවචන හමුවේ ආර්ථික ස්ථායිකරණය පවත්වා ගැනීම ශ්‍රී ලංකාව වැනි කුඩා රටවල් මුහුණදෙන අභියෝගයකි.

*ISBN 978-955-4563-72-8*

**සංඛ්‍යා සටහන් ලේඛන අංක 1: ශ්‍රී ලංකාවේ සාර්ව ආර්ථික කාර්ය සාදනය (1978 - 2014)**

| දර්ශකය | (1) 1978 | (2) 1998 | (3) 2002 | (4) 2014 |
|---|---|---|---|---|
| **ජාතික ආදායම ඩොලර් මිලියන** (US$ MN)<br><br>දළ ජාතික නිෂ්පාදන වර්ධනය අනුපාතය (Rs)<br>ඒක පුද්ගල ආදායම (US$)<br>ඒක පුද්ගල ආදායම (US$)<br><br>**ආංශික සංයුතිය**<br>කෘෂි අංශය<br>කර්මාන්ත අංශය<br>සේවා අංශය<br>ජනගහන වර්ධන අනුපාතය | 2733<br><br>8.2<br>US$ 176<br>US$ 172<br><br>32.3<br>18.4<br>44.4<br>1.8 | 15761<br><br>4.6<br>US$ 879<br>US$ 865<br><br>21<br>27.5<br>51.4<br>1.1 | 16532<br><br>4.0<br>US$ 872<br>US$ 858<br><br>20<br>26<br>53.6<br>1.4 | 74944<br><br>7.5<br>US$ 3625<br>US$ 3536<br><br>10.1<br>32.3<br>57.6<br>0.9 |
| **වෙනත් ආර්ථික දර්ශක(As % of GDP)**<br><br>සේවා වියුක්තිය ආයෝජන ඉතිරිකිරීම්<br>රාජ්‍ය ණය (ජාතික ආදායමේ % ලෙස)<br>වර්තන ගිණුමේ හිඟය | 14.7 (1978/79)<br>19.9%<br>15.3%<br>72.6 %<br>-2.4 | 9.2<br>22.2<br>19.1<br>90.8 %<br>-2.4 | 9.1<br>21.3<br>19.7<br>105.3 %<br>-4.4 | 4.3<br>29.7<br>27.0<br>98 %<br>-2.7 |
| **සමාජ ආර්ථික දර්ශක**<br><br>උපත් අනුපාතය<br>මරණ අනුපාතය<br>සාක්ෂරතාවය<br>මානව සංවර්ධන දර්ශකය<br>ආයු අපේක්ෂාකව<br>දිළිඳු අනුපාතය<br>ගිණි අනුපාතය | 28.5<br>6.6<br>86.2<br>0.653 (1980)<br>69<br>-<br>0.43 | 18.2<br>6.2<br>91.8<br>0.706 (1990)<br>-<br>28.8(1995/96)<br>0.46(1986/87) | 19.1<br>5.8<br>90.7<br>0.747(2000)<br>74<br>22.7<br>046 (2003/04) | 16.9<br>6.2<br>92.5<br>0.750<br>74<br>6.7<br>0.48 |
| විනිමය අනුපාතය $/Rs<br>පාරිභෝගික මිළ දර්ශකය | 15.15<br>227.8 | 94.00<br>2284.9 | 98.00<br>3176 | 130.56<br>5022 |

මුලය : ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාවන්

සංඛ්‍යා සටහන් අංක 1 සහ 2න් පෙන්නුම් කරන පරිදි ශ්‍රී ලංකා ආර්ථිකය පරිවර්තනීය වෙනසකට පසුගිය දශක කීපය තුල පත්වෙමින් පවතින බව පෙනේ. එය වර්ධන වේගය වැඩිවීම, ඒක පුද්ගල අදායම වැඩිවීම සහ කෘෂි අංශයේ සාපේක්ෂ දායකත්වය අඩුවීමෙන් පැහැදලිවේ. එසේ වුවද ශ්‍රී ලංකා ආර්ථික සංවර්ධනයේ අයහපත් බලපෑම් නැත්තේම නොවේ. එම තත්ත්වය වඩාත් පැහැදිලි කල හැක්කේ ගෝලිය ආර්ථික ක්‍රියාකාරිත්වය ඉදිරියේ ශ්‍රී ලංකාව සමාජ, සංස්කෘතික සහ දේශපාලන පරිවර්තනයකට ලක්ව තිබිමයි.

**සංඛ්‍යා සටහන් ලේඛන අංක 2, ඒක පුද්ගල ආදායම දෙගුනවිමට ගතවු කාලය(1960 - 2016)**

| ආර්ථික දර්ශනය | 1960 | 1978 | 1991 | 2004 | 2008 | 2016 |
|---|---|---|---|---|---|---|
| ඒක පුද්ගල ආදායම<br>දෙගුනවිමට ගතවු කාලය | 142<br><br>0 | 281<br><br>15 | 547<br><br>16 | 1062<br><br>13 | 2014<br><br>4 | 4000<br><br>8 |

මුලය:- ශ්‍රී ලංකා මහබැංකු වාර්ෂික වාර්තා

***ISBN 978-955-4563-72-8***

ශ්‍රී ලංකා මහබැංකු ඇස්තමේන්තු අනුව ලෝක ආර්ථික සංවර්ධනය මනිනු ලබන මූලික දර්ශකයක් වන ඒක පුද්ගල ආදායම දෙගුණවීම 1960 - 2008 දක්වා කාලයේදී අවස්ථා 4කදී සිදුවී ඇත. ඒ අනුව ඉහළ මධ්‍යම ආදායම්ලාභී රටක මට්ටම ලඟාවීමට ශ්‍රී ලංකාවට 2016 වසරේදී හැකිවන බවට ඇස්මේන්තු කර ඇත (මහ බැංකු වාර්තාව 2013). එය 2008 වසරේ පැවති ඒක පුද්ගල ආදායම වූ ඇ.ඩො 2014 - 2016 දී ඇ.ඩො. 4000 දක්වා ඉහල නැංවීමකි. මේ අනුව ශ්‍රී ලංකාව අඩු ආදායම්ලාභී මට්ටමේ සිට ඉහල මධ්‍යම ආදායම්ලාභී රටවල් මට්ටමට ලඟා වෙමින් පවතී.

මීට අමතරව සංඛ්‍යා සටහන් අංක 3 න් දැක්වෙන පරිදි දළ ජාතික මූර්ත නිෂ්පාදතයේ වාර්ෂික වර්ධන වේගය අනුව සලකා බැලුවහොත් පෙනියන කරුණක් වන්නේ 2001 - 2010 කාල සීමාව තුල පැවති සාමාන්‍ය වාර්ෂික වර්ධන අනුපාකය වන 5.2ට අනුව වසර 14ක පමණ කාල සීමාවකින් වර්ධනය දෙගුණ කල හැකි බවයි. එනම් බ්‍රඩ්ලි (1994) 72 නීතිය අනුව ගතවන කාලයයි. බ්‍රැඩ්ලිගේ නීතිය අනුව වර්ධනය දෙගුණවීඹට ගතවන කාලය මනිනු ලබන්නේ 72 පවත්නා ද.ජා.නි. වර්ධන අනුපාතයෙන් බෙදීමෙනි. පිළිවෙලින් ආංශික දළ ජාතික නිෂ්පාදිතයේ අංශික සංයුතිය වෙනස්වීම සැලකිල්ලට ගතහොත් කෘෂි අංශයේ දායකත්වය 1960 දශකයේදී 42% සිට 2012 වසරේදී 11.1 දක්වා අඩුවීමෙන් හා කාර්මික හා සේවා අංශවල දායකත්වය 18% සහ 42%සිට 30% හා 58% දක්වා වැඩිවීමෙන් පෙන්නුම් කරන්නේ ආර්ථිකය ව්‍යුහාත්මක වෙනසකට පත්ව ඇති බවයි. එනම් කෘෂි ආර්ථිකය කාර්මික හා සේවා මත පදනම් වූ ආර්ථිකයක් බවට පත්ව ඇති බවයි (සංඛ්‍යා සටහන් අංක 1).

**සංඛ්‍යා සටහන් අංක 3 දළ ජාතික නිෂ්පාදිතයේ සාමාන්‍ය මූර්ත වර්ධන අනුපාත වෙනස්වීම අනුව දළ ජාතික නිෂ්පාදිතය දෙගුණවීමට ගතවන කාලය.**

| දශකය | දළ ජාතික නිෂ්පාදිත වර්ධන අනුපාතය | බ්‍රඩ්ලිගේ 72 නීතියට අනුව | දෙගුණවීමට ගතවන කාලය |
|---|---|---|---|
| 1951 - 60 | 3.1 | 72 / 3.1 | 23 |
| 1961 – 70 | 4.7 | 72 / 4.7 | 15 |
| 1971 – 80 | 5.9 | 72 / 5.9 | 12 |
| 1981 - 90 | 4.3 | 72 / 4.3 | 17 |
| 1991 - 2000 | 5.2 | 72 / 5.2 | 14 |
| 2001 - 2010 | 5.2 | 72 / 5.2 | 14 |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකු වාර්තා

මෙවැනි සුභවාදී තත්ත්වයක් දේශිය වශයෙන් දැකිය හැකි වුවද ගෝලිය වශයෙන් සංවර්ධනය සඳහා එතරම් හිතකර තත්ත්වයක් නොතිබීම සාර්ව ආර්ථික අභිමතාර්ථ ඉෂ්ට කර ගැනීමට විශාල අභියෝගයක් වේ. 2007 වර්ෂයේ මැද භාගයේ සිට 2009 අවසාන දක්වා තිබූ ගෝලිය ආර්ථික අර්බුදය ශ්‍රී ලංකාව වැනි රටවල සංවර්ධනයට විශාල බලපෑමක් කරනු ලැබීය. ඉහල ආර්ථික සංවර්ධිත රටවල් ආර්බුදයට ලක්වීමෙන් එම රට වලින් ශ්‍රී ලංකා අපනයන සඳහා තිබූ ඉල්ලුම අඩුවූ අතර ඒ නිසාම සෘජු විදේශ ආයෝජන අපේක්ෂිත පරිදි ලැබුනේ නැත. එසේම ලෝක තෙල් මිළ උච්ජාවචනය වීම රටේ උද්ධමනාකාරි තත්ත්වයන් ඇති කිරිමට දැඩි බලපෑමක් සිදු කරනු ලැබීය(Henegedara, G.M. 2012). මෙමතත්ත්වය තව දුරටත් පවතින අතර දැනට යුරෝපා ආර්ථික හවුල ආශ්‍රිතව ඇතිවී ඇති ආර්ථික අර්බුදය සහ ඇමෙරිකානු ආර්ථිකය අපේක්ෂිත පරිදි යථා තත්ත්වයට පත්නොවීම ශ්‍රී ලංකා අපනයන වෙළඳපල කෙරෙහි බලපෑමක් කර ඇත. මේ නිසා 2012 ආර්ථික වර්ධන වේගය අපේක්ෂිත පරිදි 8% දක්වා ඉහල නංවා ගැනීමට අපහසු විය. (IMF)ඇස්තමේන්තු අනුව 2012 වර්ධන වේගය 6.7% ක් පමණ වන බව ප්‍රකාශයට පත් කර ඇත. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ප්‍රාථමික නිපැවුම් සහ ශ්‍රම සුක්ෂම නිපැයුම් අපනයනය කරන රටක් වශයෙන් ශ්‍රී ලංකා ආර්ථිකයේ ස්ථාවරභාවය අවදානම් සහගත වන්නේ වෙළඳ අනුපාත පිරිහීම සහ අඛන්ඩ ගෙවුම්ශේෂ හිඟයක් පැවතීම නිසයි.මෙය දැඩිඅවධානම් සහගත තත්ත්වයක් බව නීරීක්ෂකයන් පෙන්වා දී ඇත. ( ප්‍රත්පත්ති අධ්‍යයන කේන්ද්‍රය,IPS,2014)

**නිගමනය**

මෙම තත්ත්වය අනුව වර්තමානයේ ජාත්‍යන්තර මූල්‍ය අරමුදල, ලෝක බැංකුව සහ ලෝක වෙළඳ සංවිධානය වැනි ජාත්‍යන්තර ආයතනවල බලපෑම් නොමැතිව රටේ ආර්ථික සහ දේශපාලන ප්‍රතිපත්ති තීරණය කිරීම අපහසු වී ඇත. ඒ අනුව දේශිය කර්මාන්ත ආරක්ෂා කර සේවා වියුක්තියට